www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# රම්ස්ෆෙල්ඩ් හා ජෙනරාල්වරු: බෙදීම් හා ඉරාක මරාලය පිලිබඳ ගැටුම්

**Rumsfeld and the generals: Splits, recriminations over Iraq debacle**

**පැට්‍රික් මාර්ටින් විසිනි**
**2006 අප්‍රේල් 15**

ඉරාකයේ එක්සත් ජනපද යටත් කිරීම තුල, මෑත කාලයේ ප්‍රධාන ක්‍රියා කලාපයක් ඉටු කල හමුදා ප්‍රධානීන් ද ඇතුලත්, අවම වසයෙන් දුසිම් භාගයක් පමන වන ජෙනරාල්වරුන් විසින් ආරක්ෂක ලේකම් ඩොනල්ඩ් රම්ස්ෆෙල්ඩ් පිලිබඳව ප්‍රසිද්ධියේ කල විවේචන මාලාවක් මගින් බුෂ් පරිපාලනය, තවත් බැරෑරුම් දේශපාලන ප්‍රහාරයකට ලක්ව තිබේ. මෙය, තෙලින් පොහොසත් එරට තුල, විශ්වාසදායක රූකඩ තන්ත්‍රයක් අටවා ගැනීමේ එක්සත් ජනපද උත්සාහය අසාර්ථක වීමෙන් නිර්මානය කල දැවැන්ත ප්‍රතිවිපාක තව දුරටත් ප්‍රදර්ශනය වීමකි.

එහෙත් මෙම විවේචන, රම්ස්ෆෙල්ඩ්ගේ ඉල්ලා අස්වීමට බල කර එල්ල කරනු ලැබූයේ වුවද - එසේ වීමට හොඳටම ඉඩ ඇති - එමගින් පෙන්ටගන් බලධාරීන් තුල "යුද විරෝධී" මනෝගතියක පැන නැගීමක් පිලිබිඹු නොකරයි. බොහෝ විවේචකයන් ඉරාකය ආක්‍රමනය කර ජය ගැනීමේ මුල් තීරනය ආරක්ෂා කරන අතර, රම්ස්ෆෙල්ඩ් පිලිබඳ ඔවුන්ගේ විවේචන බොහොමයක් ගලා එන්නේ, මැද පෙරදිග තුල වැඩිපුර ඇමරිකානු හමුදාවන් රැඳවීමේ අභිලාෂයෙන් මිස අඩුකිරීමට නො වේ.

තවද, මාස කීපයකට පෙර විශ්‍රාම ගත්තවුන් ද ඇතුලත් ඉහල මට්ටමේ නිලධාරීන්, තම සිවිල් ප්‍රධානියාට ප්‍රසිද්ධියේ පහරදීමට ඉදිරිපත් වීම තුල, කනස්සල්ල දනවන ඇඟවීම් පවතී. දේශපාලනීකරනය වූ හමුදා නිලධරය, තම ස්වාධීනත්වය අවධාරනය කරමින් ද "ඇඟිලි ගසන දේශපාලනඥයන්ගෙන්" පලිගැනීමට බැලීමෙන් හමුදාමය මරාලයකට ප්‍රතිචාර දක්වූ ඉතිහාසයේ ප්‍රථම වතාව ද, මෙය නොවීය. ප්‍රථම ලෝක සංග්‍රාමයෙන් පසුව ජර්මනියෙන් වඩාත්ම තර්ජනාත්මක පූර්වාදර්ශය සැපයෙයි.

ප්‍රසිද්ධියේ හෙලා දැකීම් තිබියදී ම, ප්‍රසිද්ධ විවේචන වටය, ඊට ප්‍රථමයෙන්, මෙයට මැදිහත් වූ නිලධාරීන් නිසැකව ම තව මත් ක්‍රියාන්විතයේ නියැලි අනෙකුත් අය සමග ද - අතර පුද්ගලික බැඳීම් හරහා සම්බන්ධීකරනය කල බව පෙනෙන්නට තිබේ. සමහර විට, අනෙකුත් අයට ද සංඥාවක් වන, ප්‍රථම විවෘත ප්‍රහාරය, 1990 ගනන් අගභාගයේ, එක්සත් ජනපදයේ මැදපෙරදිග හා මධ්‍යම ආසියානු මෙහෙයුම් භාර මධ්‍යම ආඥාපතිව සිටි විශ්‍රාමික මැරීන් ජෙනරාල් ඇන්තනි සින්නි විසින් පල කල නව ග්‍රන්ථයක් විය. සාමය සඳහා සංග්‍රාමය පල කිරීමට අදාලව සින්නි, පසු ගිය මාසය පුරා මාධ්‍ය හමු මාලාවකට සම්බන්ධ විය. ඒවායේ දී රම්ස්ෆෙල්ඩ් තන්ත්‍රය කෙරේ පැවති දිගු කලක් ඔහුට පැවති විරෝධය ගෙන හැර පාමින්, රම්ස්ෆෙල්ඩ්ට ඉල්ලා අස් වන ලෙස දන්වමින් ඔහු ප්‍රකාශ කලේ, බුෂ් පරිපාලනය "තෙවසරක් ඉරාකය තුල කාලය නාස්ති කර" ඇති බවයි.

පසු ගිය දෙසතිය තුල, අවම වසයෙන් තවත් විශ්‍රාමික ජෙනරාල්වරු පස්දෙනෙක්, ඉරාක යුද්ධයෙන් සමස්තයක් ලෙස මිලිටරි ප්‍රතිපත්තියමත්, දුෂ් කලමනාකරනය කිරීම පිලිබඳව රම්ස්ෆෙල්ඩ් හෙලා දක තිබේ. 2003-2004 තුල ඉරාකයේ හමුදා භටයන් පුහුනු කිරීමේ ප්‍රධානියාව සිටි, විශ්‍රාමික හමුදා මේජර් ජෙනරාල් පෝල් ඉඒටන්, රම්ස්ෆෙල්ඩ් "මූලෝපායිකව ද, ක්‍රියාන්විතයේ දී උපායාත්මකව ද, අදක්ෂයෙක්" ලෙස හඳුන්වමින් ඔහුට ඉවත් වන ලෙස කියා සිටි පුද්ගලික තීරුවක් *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රයේ ලිවී ය.

2000 සිට 2002 අග දී හමුදාවෙන් විශ්‍රාම ගන්නා තෙක්, ඒකාබද්ධ ආඥාපති මන්ඩලයේ ක්‍රියාන්විත අධ්‍යක්ෂ වසයෙන් කටයතු කල ලුතිනන් ජනරාල් ග්‍රෙගරි නිව්බෝල්ඩ්ගේ පරුෂ වචනයෙන් යුත් තීරු ලිපියක්, *ටයිම්ස්* සඟරාවේ අප්‍රේල් 9 දින කලාපයෙහි පලවිය. මැරීන් ජෙනරාල්වරයා ඇෆ්ඝනිස්ථානයෙහි එක්සත් ජනපද යුද්ධයේ ප්‍රධාන සැලසුම්කරුවෙකු වුවද ඔහු, ඉරාක යුද්ධයට යෑම පිලිබඳ බුෂ් පරිපාලනයේ තීරනය, අල්කයිඩා ත්‍රස්තවාදී සංවිධානය විනාශ කිරීමේ උත්සාහයෙන් ඉවතට හැරීමක් ලෙස සලකයි.

තමන් 2002 දෙසැම්බරයේ දී විශ්‍රාම ගත් බව සඳහන් කල ඔහු "යම් දුරකට ඊට හේතු වුයේ සැප්තැම්බර් 11 ඛේදවාචකය අපගේ ආරක්ෂක ප්‍රතිපත්තිය පැහැර ගැනීමට යොදාගත්තවුන් කෙරෙහි වූ විරුද්ධත්ව ය" යයි ඔහු ලිවී ය. ඔවුන් ඉරාකය ආක්‍රමනය කිරීමේ තීරනය කරා පැනගත්තේ, මහජනතාව මිලිටරි

යථාර්ථයන් පිලිබඳ නොදනුවත් වීම නිසා ය. "ගොතනු ලැබූ යුද්ධයක් සඳහා මූලිකව ම දෝෂ සහගත සැලැස්මක් ක්‍රියාවට නැගුවේ, සැබෑ සතුරා වන අල්කයිඩාව ද්විතීයික ව්‍යායාමයක් බවට පත් කරමිනි."

අප්‍රේල් 12 වැනි බදාදා තවත් ඉරාක අන දෙන නිලධාරියෙක් මීට එකතු විය. 2004-205 වසර වල ඉරාකය තුල එක්සත් ජනපදයේ 1වන පාබල හමුදා සේනාංකයට අනදුන් මේජර් ජනරාල් ජෝන් බැටිස්ට්, රම්ස්ෆෙල්ඩ් ට පහර දෙමින් රූපවාහිනී සම්මුඛ සාකච්ඡා මාලාවකට සහභාගී වූයේ, පෙන්ටගනයේ ඉහල නායකත්වය තුල "නව ආරම්භකත්වයක්" සඳහා කැඳවුම් කරමිනි. "අපට අවශ්‍ය වන්නේ, ඔවුන් කෙරෙහි මිලිටරියේ ගෞරවය බලාපොරොත්තු වන්නා සේම මිලිටරියටද ගෞරවය දක්වන නායකත්වය"කැයි ඔහු පැවසී ය. එ මෙන්ම "බියවැද්දීමෙන් තොරව" සිය අදහස් පලකිරීමට බලධාරීන් දිරිමත් කල යුතු ය යි ඔහු තව දුරටත් කියා සිටියේ ය.

තව මත් ක්‍රියාන්විතයේ යෙදී සිටින බොහෝදෙනාගේ අදහස තමන් නියෝජනය කරන බව බැටිස්ට් සීඑන්එන් නාලිකාව හමුවේ ප්‍රකාශ කලේ ය. "ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නායකත්වයෙහි ස්වභාවය පිලිබඳව, විශ්‍රාම යෑමෙන් පසුව, මා වැනි පුද්ගලයන් කියා සිටින වෙලුම් ගනනක් දේ ඉන් ප්‍රකාශ වේ" යයි ඔහු කීවේ ය. රම්ස්ෆෙල්ඩ් කෙරෙහි විරුද්ධත්වය නිසා, තරු තුනේ නිලයකට උසස්වීමක් ගෙන යලිත් ඉරාකයට යෑම, බැටිස්ට් විසින් යලි යලිත් ප්‍රතික්ෂේප කලේ ය. එක්සත් ජනපද ආක්‍රමනයේ එක් ප්‍රධාන කාර්යධරයෙකු වූ නියෝජ්‍ය ආරක්ෂක ලේකම්, පෝල් වොල්ෆොවිට්ස්ගේ හිටපු ජ්‍යෂ්ඨ මිලිටරි සහායක ලෙස සේවය කර තිබේ.

"අප, පාලන තන්ත්‍රය බිඳ දැමීමෙන් පසුව, සාමය ගොඩනැගීමේ දුෂ්කර කර්තව්‍යය සඳහා වැඩපිලිවෙලකින් තොර, සාවද්‍ය සැලසුමක් සමග යුද්ධයට ගියෙමු. අප, නායකත්වය අවබෝධ කර නොගත්, අවිවාදාත්මකව ද උද්දච්ච හා ශක්තිමත් කන්ඩායමක් ගොඩ නොනැගූ ආරක්ෂක ලේකම්වරයෙක් යටතේ ද වැඩ කලෙමු." යයි බැටිස්ට් ප්‍රකාශ කලේ ය. ප්‍රමුඛ මිලිටරි මූලධර්මයන්, එනම්, අනදීමේදී එකමුතුකම හා අවශ්‍යතරම් යුද ශක්තිය ලබා ගැනීම සහතික කිරීම වැනි දේ උල්ලංඝනය කිරීම ගැන ඔහු පරිපාලනය විවේචනය කලේ ය.

අනදීමේ දී පරම වගකීම දරන ජනාධිපති බුෂ් ගැන සඳහන් නොකර ඔහු, රම්ස්ෆෙල්ඩ් විවේචනය කරන්නේ යයි සාකච්ඡාකරු දනුම් දුන් විට, "මාගේ අවධානය යොමු වන්නේ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙතයි. මා දන්නේ ඒ ගැනයි" යනුවෙන් බැටිස්ට් ප්‍රකාශ කලේ ය. ඉරාක ආක්‍රමනය යුක්ති සහගතදැයි යන ප්‍රශ්නයට ඔහුගේ පිලිතුර "සැකසහිත" යන්නයි. ඔහු තව දුරටත් පැවසුවේ දැන් ඉරාක ප්‍රතිරෝධය මඩිමින් "අප ජය ගත යුතුව" ඇති බවයි.

බ්‍රහස්පතින්දා වනවිට, රම්ස්ෆෙල්ඩ්ගේ නෙරපීම කැඳවුම් කරමින් තවත් විශ්‍රාමික ජෙනරාල්වරු දෙදෙනෙක් මෙයට එක්විය. ඉන් එක් අයෙක්, 2004 තරම් මෑතක් වනතුරුම ඉරාකයේ සේවය කල හමුදාවේ වඩාත් කීර්තිමත් මෙහෙයුම් ඒකකයක් වන, 82 වන ගගන සේනාංකයේ ප්‍රධානියා වූ මේජර් ජෙනරාල් කනිෂ්ඨ චාර්ල්ස් එච්. ස්වැන්නැක් විය. අනෙකා හමුදාවේ නවීකරන සැලසුම් අධීක්ෂනය කිරීමේ පෙන්ටගනයේ විෂය නිශ්‍රිත කාර්යසාධක බලකායෙහි හිටපු ප්‍රධානියා වූ මේජර් ජෙනරාල් ජෝන් රිග්ස්ය.

ස්වැන්නැක්, නිව් යෝර්ක් ටයිම්ස් පත්‍රය සමග දුරකථන සාකච්ඡාවකදී කියා සිටියේ "අප ත්‍රස්තයට එරෙහි ගෝලීය යුද්ධය කරගෙන යාම අවශ්‍යය. එය අපගේ වෙරලෙන් ඔබ්බෙහි තැබිය යුතු ය. එහෙත්, ඉරාකයේ සදාම්ට එරෙහි යුද්ධය කලමනාකරනයේ දී දක්වූ පරිපූර්න අසාර්ථකත්වය දරා සිටින ලේකම් රම්ස්ෆෙල්ඩ් එම යුද්ධය කිරීමට සුදුසු පුද්ගලයා යයි විශ්වාස නොකරන්න."

රම්ස්ෆෙල්ඩ්, ජ්‍යෂ්ඨ ආඥාපතින්වන ජෙනරාල් ජෝර්ජ් ඩබ්ලිව් කේසි හා ජෙනරාල් ජෝන් පී අබිසයිඩ් වැන්නවුන් ගේ උපදෙස් එක දිගටම නොසලකා හැරි බව ඔහු කියා සිටියේ "මගේ විශ්වාසය නම් රම්ස්ෆෙල්ඩ්, ත්‍රස්තවාදය මැඩීමේ යුද ශිල්පය හරිහැටි අවබෝධ කර නොගත් බවය" යි එකතු කරමිනි.

ඉරාක යුද පිටියේ ආඥාපතියෙක් නොවුවද, ඉහල ශ්‍රේනියේ හමුදා නිලධරයෙක් වූ රිග්ස් කියා සිටියේ, පෙන්ටගනය තුල "උද්ධච්චකමේ වාතාවරනය" ක් රම්ස්ෆෙල්ඩ් විසින් නිර්මානය කල බවයි. බොහෝ උසස් හමුදා නිලධාරීන් වර්තමාන නායකත්වයට විරුද්ධ වෙති. මක්නිසාද යත් රම්ස්ෆෙල්ඩ් හා ඔහුගේ සමීපතමයන් "දරාගත හැකි ගැටුමක් සඳහා අවශ්‍යදේ පිලිබඳව මුලුමනින්ම අවතක්සේරු කල නිසා ය. ඔවුන් විහින් මෝඩයන් වී සිටිති" යි ඔහු කියා සිටියේ ය.

වඩාත්ම වැදගත් විය හැකි, නිව් බෝල්ඩ්ගේ ප්‍රකාශද සහිත ප්‍රසිද්ධ අවලාදයන්ගේ මෙම අත්‍යසාමාන්‍ය පුපුරායාම පිලිබිඹු කරන්නේ හුදෙක්, වධ දීමේ රම්ස්ෆෙල්ඩ්ගේ පුද්ගලික ක්‍රමය - ඔහු, සමාගම්වල ප්‍රධාන නිලධාරියෙකු සිය ගැත්තන්ට සලකන ක්‍රමයට, හමුදා නිලධාරීන්ට ද සැලකීමෙන්, තෙමේම උදම් වී සිටින - පිලිබඳ කෝපය පමනක් නොව, ඉරාක යුද මරාලයේ බලපෑම් පිලිබඳව, සංස්ථාවක් ලෙස නිලධාරි කුලයේ උත්සුකයයි.

වියට්නාම් යුද්ධයේ වකවානුව තුල, තරුන නිලධාරීන් ලෙස, යුද්ධයේ දේශපාලනය හා මිලිටරි උපායන් යන දෙක ම දුෂ්කලමනාකරනය කිරීමේ ප්‍රතිඵලය ලෙස, මහජන සහයෝගය නැතිවී යාම සමග,

හමුදාවල දිරි සුන් බව හා හමුදා නිලධරයේ පැත්තෙන් අධිකාරය නැතිවී යාම පිලිබඳව, ජොන්සන් හා නික්සන් පරිපාලනයට දෝෂාරෝපනය කල, පෙන්ටගනයේ විශාල ස්ථරයක් අතරින් නිව්බෝල්ඩ් එක් අයෙකි.

ඉරාකය සම්බන්ධයෙන් ගත්විට, යුද්ධයට යාමේ තීරනය පිලිබඳව ඔවුන්ගේ අදහස කුමක් වුවත් - නිව්බෝල්ඩ් හා සින්නි එයට විරුද්ධ වූ අතර අනෙක් අය සහයෝගය දැක්වූහ. - මෙම සියලු නිලධාරින්, බුෂ් පරිපාලනයේ දේශපාලනික හුදෙකලාවීමෙහි බලපෑම පිලිබඳව භීතියට පත්වන අතර, ඉරාක යුද ව්‍යසනය ගැන චෝදනාව, නියෝග ක්‍රියාත්මක කල නිලධාරින් මතට නොව, නියෝග නිකුත්කල සිවිල් නායකයන් මතට පැවරෙන බවට සහතික කරගැනීමේ අවශ්‍යතාවෙන් පෙලෙති.

තමන් යුද්ධයට විරුද්ධ නොවූ බව සිය පාඨකයන්ට සහතික වීමට නිව්බෝල්ඩ් ඉක්මන් විය. "ඉරාකය ආක්‍රමනය කිරීම සඳහා ප්‍රකාශිත හේතුවම නොපිලිගත්තත්, මේ වෙලාවේ මගේ අදහස නම් ඉක්මනින්ම හමුදා ඉවත් කර ගැනීම වැරැද්දක් වනු ඇති බවයි." යුද්ධය මෙහෙයවීමේ දී බුෂ් පරිපාලනය සිදු කල විනාශකාරී වැරදි මාලාවක් නම් කල ඔහු, දේශපාලන අරමුනු සඳහා බුද්ධිමය තොරතුරු විකෘති කිරීමට ද සටන් සැලසුම් යලි සැකසීමට ද විරුද්ධ වීමට අසමත්වීම සම්බන්ධයෙන්, මිලිටරි නායකත්වයම විවේචනය කලේ ය.

වොෂින්ටනයේ දේශපාලන සංස්ථාපිතය පුලුල් ලෙස හෙලා දකිමින් ඔහු සමාප්ත කලේ ය. " දෙපාර්ශ්වයේම කොන්ග්‍රස් සභිකයන් නිරීක්ෂනය පිලිබඳ සිය ව්‍යවස්ථාපිත වගකීම පැහැරහැර තිබේ. මාධ්‍ය තුල බොහෝ දෙනෙක් ආක්‍රමනයට පෙර, මධ්‍යම අන දෙන මන්ඩල ප්‍රධානීන් වන ජෝ හෝර්, ටෝනි සින්නි වැනි නුවනක්කාර නිරීක්ෂකයන්ගේ අනතුරු ඇඟවීමේ සංඥා දැක තිබුනාක් මෙන් ම ප්‍රවේශම්සහගත කතා අසා තිබුන ද, ඔවුන්ගේ අදහස්වලට යෙදුවේ අඩු බරකි. දැන් ඉරාකය තුල පවතින සත්කාර්ය හා වික්‍රමාන්විත තත්වය පිරිහෙලනු ලබන්නේ ද මෙම ප්‍රවෘත්ති ආයතනයන්ම ය.

යුද්ධය පිලිබඳ මාධ්‍ය වෙත එල්ල කරන මෙම අවසාන කර්කෂ විවේචනය අන්තරායකාරී සංඥාවක් නිකුත් කරයි. යුද විරෝධී මනෝගතියට ඉන්ධන වත්කලේ යයි සැලකීම මත, වියට්නාම් යුද්ධයේ පරාජය පිලිබඳව මාධ්‍යය විවේචනය කලේ, හමුදා නිලධරයේ වැඩි කොටසක් මෙන්ම දක්ෂිනාංශික දේශපාලන සංස්ථාපිතය විසින් ය. හිට්ලර්ගේ කුප්‍රකට "පිටිපස්සෙන් සිට පිහියෙන් ඇනීමේ" න්‍යාය පිලිබඳ මෙම ඇමරිකානු අර්ථ නිරූපනය දැන්, ඉරාකයේ වෙනත් තැන්වල ඇතැයි සැලකෙන "ප්‍රගතිය" වෙතට නොව මාධ්‍ය අවධානය, බැග්ඩෑඩයේ කාර්බෝම්බ වෙතට යොමුවීම ගැන මෑතක දී ආඥාවක් පැනවූ උප ජනාධිපති ඩික්චෙනි විසින් මෙන් ම නිව්බෝල්ඩ්ගේ කරුනු දැක්වීම්වලින් ද ප්‍රතිරාවය වෙයි.

බුෂ්ගේ ධවලමන්දිරය, හිටපු නිලධාරින් විසින් කල අත්‍යසාමාන්‍ය යුදකාලීන විවේචන ප්‍රතික්ෂේප කල අතර රම්ස්ෆෙල්ඩ් වෙනුවට අයෙක් පත් කිරීම පිලිබඳ කුමන හෝ අදහසක් හෙලාදැකී ය. එහෙත් ඉහල තැනක සිටින මාධ්‍ය නිරීක්ෂකයෙක් හා ඉරාක යුද්ධයේ ආධාරකරුවෙක් වන *වොෂින්ටන් පෝස්ට්* පත්‍රයේ ඩේවිස් ඉග්නේෂස් පෙන්ටගන් නිලධාරින්ගේ ගනන් බැලීම් අනුව හමුදා නිලධරයේ සියයට හැත්තෑ පහක් පමන ම දැඩි ලෙස රම්ස්ෆෙල්ඩ් හට විරුද්ධ බව සඳහන් කලේ ය. ඉග්නේෂස් යෝජනා කලේ ආදේශකයක් ලෙස, ප්‍රමුඛ යුද පාක්ෂික කොන්ග්‍රස් සභිකයෙක් - ඩිමොක්‍රටික් සෙනෙට් සභික ජෝසෆ් ලිබර්මාන් විය හැකි ය - ඒ සඳහා පත් කිරීම ගැන පරිපාලනය විසින් සලකා බැලීම සුදුසු බවයි.

© www.wsws.org